# මගේ සෙල්ලම් ටෙඩියා



මිහෙළි සනායා විජේරත්න

# මගේ සෙල්ලම් ටෙඩියා

මිහෙළි සනායා විජේරත්න

2023.11.01

ISBN අංකය - 978-624-206-751-3

කතෘගේ වෙනත් කෘති - "මගේ සරුංගලේ"

මුද්‍රිත දිනය - 2020.12.26

ISBN අංකය - 978-624-97024-0-0

# පිදුම

මා ඉතා ආදරයෙන්

රැක බලා ගන්නා

මගේ දෙමාපියන්ටත්,

මාගේ දෙවන මව ලෙස

මට ගුරුහරුකම් දෙන

මාගේ ගුරු මෑණියන්ටත්

ඉතා ආදරයෙන්

මෙම පොත පිළිගන්වමි.

# <u>ස්තූතිය</u>

මෙම පොත ලිවීමට

මට උදව් කළ හැම දෙනාටම

ස්තූතියි

මිහෙළි

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශිය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත්පොතක් ” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක් ” ව්‍යාපෘතයට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රර්ථානා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසල් කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නානා අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමඟින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-11.01

මගේ ටෙඩියා හරිම ලස්සනයි. මම මගේ
ටෙඩියා එක්ක හැමදාම සෙල්ලම් කරනවා.





මම යන හැම තැනම මගේ ටෙඩියා ගෙනියනවා.



ඉතින් එක දවසක් මම මගේ ටෙඩීව අරන් අත්තම්මලාගේ ගෙදර ගියා. මම උදේ ඉඳලා හවස් වෙනකල් ටෙඩියා එක්ක සෙල්ලම් කළා.



අම්මා මට රෑ කෑම කන්න එන්න කිවුවා. මම මගේ ටෙඩීව පැත්තකින් තියලා කෑම කන්න පටන් ගත්තා. අපි හැමෝම ආහාර ගෙන අවසන් වුණා. ගෙදර යන්න සූදානම් වුණා.






අම්මා තාත්තාගෙන් ඇහුවා බඩු ඔක්කොම ගත්ත ද කියලා? තාත්තා ඔව් කිව්වා. අපි අත්තම්මාට වැඳ ගෙදර යන්න පිටත් වුණා.



ටික දුරක් යන විට මට මතක් වුණා, මගේ ටෙඩියා ගේන්න අමතක වෙලා කියලා. අම්මා කිවුවා, අපි අත්තම්මලා ගෙදර වෙන දවසක ගිහිල්ලා ඒක ගමු කියලා.





ඒත් මට ගොඩාක් දුක හිතුණා. මම හයියෙන් ඇඬුවා.



තාත්තා ආපසු අත්තම්මලාගේ දිහා ගිහින් මගේ ටෙඩියාව ගෙනත් දුන්නා. මට ගොඩාක් සතුටු හිතුණා.



හොඳ පුංචි ළමයි දුක් වෙන්න හොඳ නෑ ඒකයි මම ටෙඩියාව ආයෙම ගෙනත් දුන්නේ, තාත්තා කිව්වා.





මම ආදරෙන් තාත්තාව තුරුළු කරගත්තා.

අම්මාටත් සතුටුයි.





**පසුවදන**

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදන වූ මෙම විද්යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත් කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු. . .

මෙයට

සෙනෙවිරත්න මහ ලේකම්

**පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක**

2023-11-01

ISBN අංකය - 978-624-206-751-3